
## නව මාධ්‍ය ප්‍රවනතා

# ප්‍රජාතන්ත්‍රවාදය පාර්ලිමේන්තුව හා විද්‍යුත් මාධ්‍ය ප්‍රවේශය

*මේ වන විට බටහිර යුරෝපයේ හා නැගෙනහිර යුරෝපයේත්, ඇමරිකා එක්සත් ජනපදය සෝවියට් දේශය ප්‍රධාන රටවල් 58 ක පාර්ලිමේන්තු සංවාද විකාශය කෙරෙමින් පවතී.*



**පියදස රත්නසිංහ**

පාර්ලිමේන්තුව ජනතා නියෝජිතයන්ගෙන් සැදුම් ලද උත්තරීතර ආයතනය යි. පාර්ලිමේන්තුවේ ගනු ලබන තීරණයන්, එහි පැවති විවිධ සංවාදයන් අසා දැක ගැනීමේ අයිතිය ජනතාව සතු ය. මෙම උත්තරීතර සභාවේ පැවැත්වෙන සංවාද, විවාද පිළිබඳ දැන ගැනීමට ඇති ප්‍රධානතම ප්‍රකාශනය "හැන්සාඩ්" වාර්තාව යි. ඊට අමතරව පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මගින් ද ප්‍රකාශයට පත් වෙයි. සන්නිවේදන තාක්ෂණය ලබා ඇති දියුණු හා සංකීර්ණත්වය පිළිබඳව වැඩි අවධානයක් ලබා ඇති අවධියක ශ්‍රී ලංකා පර්ලිමේන්තුවේ විවාද එසැනව(Live)දැක ගැනීමේ අවස්ථාව ශ්‍රී ලාංකිකයින්ට ලැබෙන දවස වැඩි ඈතක නොවේ.

මෙවන් අවධියක දේශ දේශාන්තරයන් හී පාර්ලිමේන්තු වාද විවාද දැක්වීම පිළිබඳව මඳක් සලකා බැලීම කාලීන ය.

විශේෂයෙන් පාර්ලිමේන්තු සම්ප්‍රදයන් පිළිබඳව පූර්වාදර්ශ ලබා ගන්නා, ගුරු හරුකම් ලබා ගන්නා බ්‍රිතාන්‍යයේ තත්ත්වය අපගේ සැලකිල්ලට ලක්වේ.

බොබ් ෆ්‍රැන්ක්ලින් (Bob Franklin) විසින් සංස්කරණ කරන ලද ප්‍රජාතන්ත්‍රවාදය විකාශය (Televising Democracies) නැමැති කෘතියෙන් උකහා ගන්නා ලද කරුණු කිහිපයක් වැදගත් කොට සැලකිය හැකි ය.

ප්‍රථම වතාවට පාර්ලිමේන්තු සභා ගැලරියට පිවිසීමට පුවත්පත් වාර්තාකරුවනට (Journalist) අවසර දුන් අවස්ථාවේදී පැනක් ගෙන යැමට අවසර දී නැත. පාර්ලිමේන්තු විවාද එසැනව විකාශයට අවසර දීම එවකට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ කථානායක වූ බර්නාඩ් විදරිල් (Bernard Wetherill) හඳුන්වා ඇත්තේ "හොඳ ප්‍රසංගයක්" (The Best Show in Town) විය හැකි බවයි. රොජර් ගේල්(Roger Gale)නැමති මාධ්‍යවේදියා තොරතුරු වහනය ප්‍රසංගීකරණයක් (might become a info-tainment) වශයෙන් දකී. බ්‍රිතාන්‍යයේ අග්‍රාමාත්‍යවරයකු වූ වින්ස්ටන් චර්චිල් නව මාධ්‍යය (විද්‍යුත්) පිළිබඳ සුභවාදීව සැලකූ අයෙකු නොවේ. ඔහු පාර්ලිමේන්තු විවාද එසැනව දැක්වීම පිළිබඳව (Nothing less than a Red Conspiracy) පළකර ඇත්තේ රතු කුමන්ත්‍රණයට නොදෙවෙනි විය හැකි ලෙසිනි. තවදුරටත් අදහස් දක්වන චර්චිල් කියා සිටියේ පාර්ලිමේන්තු විවාද පෙන්වීම කම්පනයක් ඇති කරවන සුළු (Shocking thing) බව ය. දින 14 ක නියමය (Fourteen Day Rule)අනුව 1950 ගණන්වල පාර්ලිමේන්තුවේ සාකච්ඡා කිරීමට නියමිතව තිබූ මාතෘකාවක් පිළිබඳව නියමිත දිනයෙන් දින 14 ක කාල සීමාවක් තුළ රූපවාහිනී සාකච්ඡා පැවැත්වීමට අවකාශ නොලැබිණි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ අවශ්‍යතාව පිළිබඳව කොකරැල් (Cockerrall- 1988) අවධාරණය කරන ලද්දේ පාර්ලිමේන්තු විවාද සජීවීව විකාශය කිරීමෙන් ඊට බලපෑමක් විය හැකි හෙයිනි.

බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුවේ විවාද එසැනව විකාශය කිරීමට පෙර ඒ පිළිබඳව පක්ෂව හා විපක්ෂව කණ්ඩායම් අතර දීර්ඝ කාලයක් සාකච්ඡාවට බඳුන් විය.

බ්‍රිතාන්‍යයේ තත්ත්වය එසේ වුවත් මේ වන විට බටහිර යුරෝපයේ හා නැගෙනහිර යුරෝපයේත්, ඇමරිකා එක්සත් ජනපදය සෝවියට් දේශය ප්‍රධාන රටවල් 58 ක පාර්ලිමේන්තු සංවාද විකාශය කෙරෙමින් පවතී. කුවින්ටන් හොග් (Quinton Hogg) පාර්ලිමේන්තු විවාද විකාශය පිළිබඳ දරණ මතය පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය, උත්තරීතරතාව පිළිබඳ අවධානයට ගන්නා ලද්දකි.

පාර්ලිමේන්තුව ඊට ආවේනික තත්ත්වයෙන් පැවැතිය යුතු බව ඔහුගේ අදහස ය.

1988 පෙබරවාරි මස 9 දින අත්හදා බැලීමේ පදනම මත රූපවාහිනී කැමරා සභා ගර්භයට ගෙන ඒමට එකගත්වය ඇති වූ අතර එම කටයුතු අධීක්ෂණය කිරීමටත් විධි විධාන යෙදීමටත් තේරීම් කාරක සභාවක් පත් කරන ලදී.

මෙම නියමයන් අනුව ප්‍රථම වරට රූපවාහිනී කැමරා එසැන වැඩසටහන් සඳහා ගෙන ඒමට අවසර දෙනු ලැබුවේ 1989 නොවැම්බර් 21 දින දී ය. පාර්ලිමේන්තුවේ සැසි වාරය විවෘත කිරීම ඒ අනුව සජීවීව විකාශය කිරීමට තීරණය විය. මෙකී තීරණය ගැනීමට පෙරාතුව 1985 සිට 1988 දක්වා කාලය තුළ විවාද 12 ක් මේ පිළිබඳව පවත්වා තිබේ. සභා ගැබට කැමරා ගෙනවිත් සජීව විකාශ පැවැත්වීම පිළිබඳව එකගත්වය (Favor) පළ වී ඇත්තේ අවස්ථා දෙකක දී පමණි. පාර්ලිමේන්තු විවාද එසැනව විකාශය කිරීමට පක්ෂ විවිධ කණ්ඩායම් ප්‍රධාන වශයෙන් තමන් නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සම්බන්ධවන විවාද පිළිබඳව දැන ගැනීමට ජනතාවට ඇති අයිතිය පිළිබඳව අවධාරණය කරයි.

තවත් අතකින් ජනතා සහභාගීත්වය හා අධ්‍යාපනික වශයෙන් ඇති වැදගත්කම පිළිබඳව සුභවාදීව තර්ක කරයි.

රූපවාහිනිය අනෙකුත් සන්නිවේදන මාධ්‍ය අභිබවා පෙරමුණේ සිටින මාධ්‍යයක් බැවින් වැඩි පිරිසක් අතරට ක්ෂණිකව පිවිසීමට ඇති හැකියාව වඩාත් ප්‍රබල අදහසක් ලෙස ද ඉදිරිපත් වී ඇත.

පාර්ලිමේන්තු සභා ගැබට රූපවාහිනී මාධ්‍ය පිවිසීම පිළිබඳව විරෝධ ආකල්ප දක්වන කණ්ඩායම් ප්‍රධාන වශයෙන් ම තාක්ෂණික වශයෙන් ඇති විය හැකි ගැටළු ගැන අවධාරණය කරති.

පාර්ලිමේන්තු සම්ප්‍රදායන් විසින් ආරක්‍ෂා කරගෙන ආ අසිතිත් කෙරේ කරන බලපෑම් ද ඉදිරිපත් වේ. විරෝධාකල්ප දක්වන පිරිස 1965 සිට ව්‍යවස්ථානුකූල ගැටළු මතුවීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරති. රූපවාහිනී කැමරාවල ප්‍රමාණය හා ඒවා සභා ගැබේ ස්ථානගත කිරීම පිළිබඳ ගැටළු තවත් ප්‍රශ්නයකි. එසේම හොඳ රූපවාහිනී ආවරණයක් ලබා දීමට නම් මනා ආලෝකකරණයක් හා මයික්‍රෆෝන භාවිතය පිළිබඳව පැන නැගෙන ප්‍රායෝගික ගැටළු පෙන්වා දෙනු ලැබ ඇත. එපමණක් නොව රූප රාමු තෝරා බේරා ගැනීමේ දී නිෂ්පාදකයාට හෝ අධ්‍යක්ෂක වරයාට ඇති අසීමිත බලතල තුළ මධ්‍යස්ථව මනා ආවරණයක් ලබා දෙන්නට හැකි දැයි දැඩි විරෝධයක් ඉදිරිපත් වී තිබේ. මේ අනුව ප්‍රේක්ෂකයින්ට දැක ගන්නට ලැබෙන්නේ අධ්‍යක්ෂක වරයාට රුචිකර දර්ශනයකින් පමණි. එහෙයින් එවැනි බලයක් ඇති රූපවාහිනියට පාර්ලිමේන්තුව සතු ස්වාධීනත්‍ව පාලනය කිරීමට අවකාශ ලැබේදැයි නැගෙන භීතියක් මතු කර තිබේ. මේරියන් රෝ මේ තත්ත්වය යටතේ පාර්ලිමේන්තු විවාද පෙන්වීම රූපවාහිනියේ ජයග්‍රහණයක් වුවත් දේශපාලන වශයෙන් පරාජයක් බව පෙන්වා දෙයි. පෙර පෙළ මෙන්ම විරුද්ධ පාක්ෂිකයින් වැඩි කාලයක් ලබා ගැනීමට ඉඩ ඇති බවත් සුළු පක්ෂවලට තැනක් නොලැබෙන තත්ත්වයක් උදවිය හැකි බවටද මතයක් පවතී.

1988 පෙබරවාරි 9 වැනිදා පැවති විවාදයේ දී වැඩි ඡන්ද 54 කින් සම්මත වූ විවාදය තුළින් සජීවී විකාශයෙන් එළි දක්වීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට අවස්ථාව එළි පෙහෙළි විය.

අංශ 4කින් විවාදයට භාජනය වූ කරුණකි පාර්ලිමේන්තුව සජීවී කැමරා පිවිසීම තාක්ෂණික අංශයෙන්, පාර්ලිමේන්තුවට ගෞරවය, විපක්ෂ දේශපාලනය, පාර්ලිමේන්තු සම්ප්‍රදායන් යන අංශ සම්බන්ධයෙන් මෙකී තර්ක විතර්ක ඉදිරිපත් වී තිබේ.

පාර්ලිමේන්තු විවාද විකාශයේ දී එය සිදුවිය යුත්තේ රාජ්‍ය මාධ්‍ය හරහා ද පෞද්ගලික වාණිජ සේවාවන් හරහා ද යන්න ද සාකච්ඡාවට බඳුන් වී ඇත. BBC හා ITN ඒකාබද්ධව විකාශයන් කළ යුතු බව මත ඉදිරිපත් වී ඇත. තේරීම් කාරක සභාවට ඉදිරිපත් වූ BBC/ITN ඇස්තමේන්තුව බ්‍රිතාන්‍ය පවුම් 520,000/-ක් විය. එය පිළිබඳව තේරීම් කාරක සභාව එකඟත්වයක් නොදක්වූ අතර ඔස්ටින් මයිකල් නැමැත්තා BBC/ITN ඇස්තමේන්තුව සාධාරණීකරණය කරමින් කරුණු දක්වූ බවත්, විශේෂයෙන් සුවිශේෂ වැඩසටහන් ආවරණය කිරීම සම්බන්ධව මෙම ආයතනය දක්වා ඇති නිපුණත්වය හා පළපුරුද්ද අවතක්සේරු නොවිය යුතු ය. 1990 ජූලි 19 ද ස්ථිර පදනමක් යටතේ විවාද විකාශය කිරීමට සභාව එකඟ විය.

මංගල සජීව විකාශය 1989 නොවැම්බර් 21 දින ප.ව. 2.30 සිට පුරා පැය හතරහමාරක් තුළ විකාශය කෙරිණි. රූපවාහිනී කැමරා පාර්ලිමේන්තු සභා ගැබට විවෘත විය යුතු බව අනෙව්රින් බෙවන්(Aneurin Bevan) යෝජනා කර ඇත්තේ 1959 නොවැම්බර්යේ ඔහුගේ මරණයට දින කිහිපයකට පෙරදී ය. 1963 දී රොබින් ඩේ(Robin Day) නුදුරු අනාගතයේ දී රූපවාහිනී කැමරා සභා ගැබට කැඳවන වගට අනාවැකි පළ කර ඇත. හැරල්ඩ් මැක්මිලන් අගමැතිවරයාගේ රජයේ ප්‍රධාන ආණ්ඩු පක්ෂ සංවිධායක සමග පාර්ලිමේන්තුවට ජෝන් ග්‍රිස්ට්(John Grist) ගිය බවත් එහිදී කැමරා ස්ථාන ගත කළ යුතු තැන් පිළිබඳව පෙන්වා දුන් වගත් සිහිපත් කරයි.

පාර්ලිමේන්තු විවාද ප්‍රචාරය පිළිබඳව දේශපාලකයින් අතර පමණක් නොව මාධ්‍ය හසුරුවන්නන් අතර ද තරගයක් පැවතිනි. පාර්ලිමේන්තු මන්ත්‍රී වරයකු වූ රිචර්ඩ් ක්‍රොස්මන්, ජෝන් ග්‍රිස්ට්ගෙන් මෙම කාර්යය පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීමට ඉල්ලීමක් කළ විට එවකට බීබීසියේ අධ්‍යක්ෂ ජනරාල් වරයා තමන්ගේ අනුමැතියෙන් තොරව එසේ කිරීම නොකළ යුතු බවට නියමයක් කර ඇත.

පාර්ලිමේන්තු සංවාද සජීවී ඉදිරිපත් කිරීමේ දී බ්‍රිතාන්‍යයෙන් ගත යුතු පාඩම් රැසක් වෙයි. ❑